186

# ඡායාරූපමය පුවත්පත් කලාව පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්


**උදිත ගුණසේකර**

විද්‍යාවේදී (ගෞරව)



කැලණිය විශ්ව විද්‍යාලයේ

දර්ශනපති (ජනසන්නිවේදන විධි)

උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධනය 1998

# හැඳින්වීම

ඡායාරූපයක් පුවත්පත් පිටුවක ප්‍රතිනිර්මාණය කිරීමෙන්, වචන සමූහයක් පුවත්පතෙහි මුද්‍රණය කළ විට ගොඩනැගෙන සන්නිවේදන ප්‍රතිඵලයට වඩා වෙනස් වූ අත්දැකීමක් ජනිත වේ. එහෙත් පුවතක් ගැන කරුණු ඉදිරිපත් කිරීමේ දී කිව යුතුව ඇති සියල්ල ඡායාරූපයෙන් ම පමණක් ප්‍රකාශ කිරීම ද දුෂ්කර බව හැඟේ. එවිට ඊට ආධාරක වශයෙන් වචනය ද යොදනු ලබයි.

මෙහි අනික් පැත්ත ද මේ හා සමාන ම ය. යමක් කොපමණ වචන වැය කරමින් පැහැදිලි කළ ද තත්වාකාරය අවබෝධ කරදීම දුෂ්කර වන අවස්ථා බොහෝ ය. මෙවිට වචනයේ, නොඑසේ නම් භාෂාවේ සහාය පිණිස ඡායාරූප ද ඉදිරිපත් කෙරේ.

මේ කවර විටෙක වුව ද සිදුවන්නේ ඡායාරූපයත් භාෂාවත් එක්ව සාමූහික සන්නිවේදන ක්‍රියාවක් ගොඩනැංවීමයි. ඡායාරූපමය පුවතක අඩංගු වන භාෂාමය හා රූපමය සංරචක, ඒ එක එකක් විසින් වියුක්තව දරා සිටින වටිනාකම් මෙහි දී ද නියෝජනය කරයි. එහෙත් රූප - භාෂා සඳාතිත්වය පවත්නා කල රූපයේ සමහර තත්වයන් භාෂාව හා එක්ව යෙදීම ද, භාෂාවේ සමහර ප්‍රකාශන ස්වභාවයන් රූපය හා සමග එක්ව යෙදීම ද නොපෑහේ. මෙහි දී ඡායාරූපයෙහි භාෂාව කෙරේ වූ නැඹුරුවකුත් භාෂාවේ රූපය කෙරේ වන යොමුවකුත් පැවතිය යුතු ය. එසේ නොවන කල එතැන බිහිවන්නේ ඡායාරූපමය පුවත්පත් කලාවක් නොවේ. එය, 'රූපයක් අසලින් විස්තරයක්' පළකිරීම පමණකි. එය ඡායාරූපය හෝ විස්තරය තුළ වන ප්‍රතිසන්නිවේදන ගැටළු සමනය නොකරන අතර පාඨකයාට ද නව අත්දැකීමක් නොසපයයි.

ඡායාරූපයක් හා වදනක් අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් සහිතව ඉදිරිපත් කිරීම ඡායාරූපමය පුවතක් නිර්මාණය කිරීම ලෙසත් එය මුද්‍රිත වාර ප්‍රකාශන හා පුවත්පත්හි බහාලීම ඡායාරූපමය පුවත්පත් කලාව ලෙසත් අපි සාමාන්‍යයෙන් තේරුම්ගෙන සිටිමු. මෙය Photojournalism යන ඉංග්‍රීසි වදනින් සලකුනු කරනු ලබනු අතර, තවමත් අලුත් විෂයයකි. ඡායාරූපමය පුවත් සැපයීම හා සන්නිවේදන ධාරාව රඳාපවතිනුයේ පාඨකයා තුළ වන සන්නිවේදන පිපාසය මත යැයි එක්වර ම අපට සිතෙන නමුත් එය එතරම් නිරවද්‍ය නොවේ. පාඨක රුචිය ඡායාරූපමය පුවත්පත් කලාව මෙහෙයවනු ලබන එක් සාධකයක් වන අතර, බොහෝ සමාජ, ආර්ථික, දේශපාලනික, මනෝ විද්‍යාත්මක හා ජීව විද්‍යාත්මක තත්වයන් ද සහෝදර මාධ්‍යයන්හි හැසිරීම් ද ඊට සෘජු බලපෑම් ඇතිකරන බව මෙම අධ්‍යයනයේ දී පැහැදිලි විය.

එසේ ම ඡායාරූපමය පුවතක ප්‍රකාශනාත්මක වටිනාකම් දේශීය, හා ජාත්‍යන්තර මට්ටම්වලින් හඳුනාගෙන එය වැඩි දියුණු කරලනු සඳහා ගත හැකි පියවර පිළිබඳව ද මෙහි දී සාකච්ඡා කෙරිණි. දේශීය වශයෙන් ඡායාරූපමය පුවත්පත් කලාවේ ශක්‍යතා හා සීමා පිළිබඳ ප්‍රමාණවත් තරම් අවබෝධයක් නොමැතිකම නිසා අප බොහෝ මාධ්‍ය සම්පත් නිරර්ථක ලෙස නාස්ති කර දමන බව ද මෙහි දී උදාහරණ සහිතව පෙන්නුම් කිරීමට හැකි විය.

මේ තත්වය යටතේ වඩා අර්ථවත් ඡායාරූපමය පුවත්පත් කලාවක් සඳහා ශාස්ත්‍රීය පසුබිමක් ගොඩනංවාගැනීම මෙමගින් අරමුණු කෙරිණ. ඒ සඳහා ඡායාරූපයේ මුද්‍රිත මාධ්‍ය තුළ යෙදීම් පළමු පරිච්ඡේදය මගින් සාකච්ඡාවට භාජනය කොට ඉන් මතුකෙරන සන්නිවේදන ලක්‍ෂණ ඉස්මතු කෙරිණ. ඡායාරූපයේ ප්‍රවෘත්තිමය ඉදිරිපත් කිරීම් කෙරේ ලත් ග්‍රාහක ප්‍රතිචාර හා ඒ ඔස්සේ ඡායාරූපමය පුවත්පත් කලාව ක්‍රමික ලෙස විකාශනය වූ අයුරු එහි දී අධ්‍යයනය කෙරිණ. විධිමත් ඡායාරූපමය පුවත්පත් කලාව බිහිවීමට පසුබිම් වූ වටාපිටාවත්, ඉන් ඡායාරූපමය පුවතක් සඳහා ආරෝපනය වූ සමාජගත පෞරුෂයත් එහි දී නිරූපනය විය.

ඡායාරූපමය සන්නිවේදන ක්‍රියාවක පදනම වන ඡායාරූපයත්, ඒ හා සබැඳෙන භාෂාමය ප්‍රවේශයත් වෙන්ව ගෙන ගැඹුරින් අර්ථකථනය කිරීම දෙවන පරිච්ඡේදය ආරම්භයේ දී සිදුකෙරිණ. අනතුරුව රූපය හා වචනය සංයුක්තව ගත් කල මතුවන තත්වය සැලකිල්ලට ගනිමින් ඡායාරූපමය පුවත්පත් කලාව, පවත්නා හා නව අර්ථකථන ඔස්සේ පැහැදිලි කරන ලදී. වඩා විද්‍යාත්මක ලෙස වටහාගත් ඡායාරූපමය ප්‍රවෘත්ති කලා භාවිතයන්හි විවිධ යෙදීම් වෙන්ව ගෙන, වාර්තා ඡායාරූපකරණය හා එහි වන වෙනස ද මෙහි දී මතු කර දක්වනු ලැබිණ. ඡායාරූපමය පුවතක දී භාවමය වශයෙන් ඇතිකරන පෙලඹීම් ගැන මෙම පරිච්ඡේදයේ දී වැඩිදුරටත් සාකච්ඡා විය.

තුන්වන පරිච්ඡේදය වෙන්වූයේ ඡායාරූපමය පුවත්පත් කලාවේ පදනම වන දෘශ්‍ය සංරචකයේ නිර්මාණාත්මක යෙදීම් සලකා බලනු පිණිස ය. ඡායාරූපය සන්නිවේදනාත්මක සහ උපක්‍රමික වශයෙන් අර්ථවත් කිරීමට ඇති හැකියාව හා භාවිතයන් මෙන් ම සීමා ද එහි දී සාකච්ඡා කෙරිණ. අපගේ ප්‍රස්තුතයේ වන මනෝවිද්‍යාත්මක වටිනාකම් සියුම්ව වටහාගෙන එය වැඩි දියුණු කිරීමට ඡායාරූපය යොදාගත හැකි ආකාරය මෙමගින් නිරූපනය විය.

යථෝක්ත පරිච්ඡේදයෙන් ඉස්මතු කෙරෙන න්‍යායික කරුණු හා ප්‍රායෝගික යෙදීම්වලට ඡායාරූපමය පුවත්පත් කලාව තුළ ලැබෙන ඉඩ ප්‍රස්තා සසඳමින් ඡායාරූප ප්‍රකාශන කලාවේ සන්නිවේදන විධි සඳහා ඊ ළඟ පරිච්ඡේදය වෙන් වේ. රූපය හා වචනය අතර පවත්නා වඩා දියුණු ඌනපූරක සබඳතා, සංජානන ස්වරූප හා ඉන් ජනිත වන සංස්කෘතික ලක්ෂණ ගැන ද මෙහි දී සලකා බැලීම්. ප්‍රවෘත්ති, විශේෂාංග හා දැන්වීම් යන අංශත්‍රයෙහි ම යෙදෙන ඡායාරූපමය වහර සහ සැලසුම් විධි හා රූපාවලි ක්‍රමය ගැන ද පුළුල් ව මෙහි දී සාකච්ඡා කොට ඇත. ඡායාරූපයේ උපරිම සන්නිවේදන ප්‍රතිඵල ළඟාකරගනු වස් අත්‍යවශ්‍ය වන පූර්ව නිගමන, පූර්ව සූදානම හා පූර්ව අනුමානයන් සහ ඒ සඳහා වඩා උචිත වන නිරූපනාත්මක ආකෘතියක් ද පරිච්ඡේදය අවසානයේ දී ඉදිරිපත් කෙරේ.

අවසන් පරිච්ඡේදයේ දී වර්තමාන මාධ්‍ය යාන්ත්‍රණය තුළ ඡායාරූපමය පුවත්පත් කලාවට හිමි තක්සේරුව ඇගයීමට ලක් කොට එහි විවිධාකාර යෙදීම් හා ඵලදායිතා පිළිබඳ සාකච්ඡා කෙරේ. වෘහත් සන්නිවේදනය (Mega Communication) තුළ කෙටි ප්‍රවෘත්ති (Factoids) ක්‍රම, නව අත්හදාබැලීම් මෙන් ම විකල්ප සන්නිවේදන ප්‍රවේශයන් සඳහා වන ඉඩප්‍රස්තාද විමර්ශනය කරනු ලබයි. වාරණය හා ඉන් මිදීමේ අවශ්‍යතා මෙන් ම ඒ ඒ සීමාවන් ජයගැනීමට ඡායාරූපමය පුවත්පත් කලාවට පවත්නා හැකි නොහැකියාවන් ද සැලකිල්ලට ගෙන තිබේ. සන්නිවේදන ඒකකයක පැවතිය යුතු යැයි පිළිගන්නා 5W & H න්‍යාය ඡායාරූපමය පුවත්පත් කලාවට අදාළ කරගනිමින් නව ආකෘතියක් ද ඉදිරිපත් කෙරේ. ඡායාරූප පුවත්පත් කලාවේදියා (Photojournalist) යනු කවරෙක් ද? ඔහුගේ යුතුකම්, වගකීම් හා අයිතිවාසිකම් ගැන ද යෝජනා සමූහයක් මෙහි දී දක්වා තිබේ. ඒ ඔස්සේ වඩා සංවේදී ඡායාරූපමය පුවත්පත් කලාවක් ගොඩනැංවීමට අවශ්‍ය සාධකයන් හා පසුබිම මෙම අධ්‍යයනය ඔස්සේ ඉස්මතු කර දක්වනු ලබයි.

ඡායාරූපමය පුවතකින් කෙරෙන තොරතුරු සන්නිවේදනය මෙම අධ්‍යයයේ දී මූලිකව සලකා බැලූ නමුදු, එහි වන අතුරු ප්‍රතිඵලයන් ද නොසලකා හැර නොමැත. වඩා ආකර්ශනීය ලෙසත් බුද්ධිගෝචර ලෙසත් පුවත්පතට බලපෑම් කරන ඡායාරූපය, විටෙක සියල්ල අබිබවා ගිය වින්දනාත්මක වටිනාකම් ද ජනිත කරවයි. තාක්‍ෂණය හා කාර්මික විද්‍යාත්මක ජයග්‍රහණයන්ගේ ප්‍රතිඵල මත උපත ලද කලා අංග ඉතිහාසය තුළ බිහිව ඇත්තේ අතළොස්සකි. සිනමාව හැරුණු කොට කලාවක් වශයෙන්[1]

1. ජයතිලක, චතුර: 'සිනමාව, සිනමාත්මකතාව හා සිනමා සෞන්දර්යවේදය, චිත්‍රපට මාධ්‍යය : සංස්කෘතික අමාත්‍යාංශය: සංස්කරණය ගාමිණී වේරගම, චිත්‍රපට අනුමණ්ඩලය, 1994, පිටු49 - 66

වර්ධනය වීමට එයින් හැකියාවක් ලබා ඇත්තේ ඡායාරූපකරණය හා යම්තාක් දුරට වර්තමානයේ රූපවාහිනිය පමණි.

පුවත්පතක මූලික සීමාව වන භාෂාමය විසද්සදාණය අතික්‍රමණය කොට රට සර්ව භාෂාත්මක වටිනාකමක් ගෙනදීමට ඡායාරූපය නිසා හැකි විය. එසේ ම අධ්‍යාපනික, භූගෝලීය, වයස්, ස්ත්‍රී පුරුෂ මේ ආදී බොහෝ සීමාවන් ජයගන්නා ඡායාරූපය, පුවත්පත් පිටුව මත දී වඩා සන්නද්ධ තොරතුරු ප්‍රකාශන හැකියාවක් පෙන්නුම් කරයි. එබැවින් මෙම පර්යේෂණය මුළුල්ලෙහි ම ඡායාරූපීය තොරතුරු සම්පාදනය සමග එන අනිකුත් වටිනාකම් ද වැදගත් කොට සලකන ලදී. එමගින් අවසානයේ ඡායාරූපමය පුවත්පත් කලාවේ නව ප්‍රවණතා හා සංවර්ධනාත්මක පියවරයන් යෝජනා කළ හැකි විය. එමගින් ඡායාරූපමය පුවත්පත් කලාව යනු විද්‍යුත් සන්නිවේදනයට ද නෑකම් කියන, එසේ ම ඉක්මනින් සංවර්ධනය වෙමින් පවත්නා සහ නව සමාජයට ඔබින පුවත් සම්පාදන ක්‍රමවේදයක් බැව් තහවුරු කෙරිණි.

18 -10- 2001